**මාසික මහ සභා රැස්වීම් වාර්තාව**

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2025.06.20
වේලාව :- පෙ.ව. 10.00

**සහභාගිත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
16. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
17. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
18. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
19. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
20. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
21. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
22. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
23. පී.ජී.මල්ලිකා මැතිතුමිය
24. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
25. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
26. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
27. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
28. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
29. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
30. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
31. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
32. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය

**නිලධාරී සහභාගිත්වය**

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ). 2023.03.14 දින පැවති මාසික මහා සභා වාර්තාව සම්මත කිරීම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2023.03.14 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව අවුරුදු 02 ක් පමණ කාලයක් වන බවත්,ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා එම කාලයේ නොසිටි බැවින් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා විසින් මෙම **මහා සභා වාර්තාව** ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා

2023.03.14 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව අවුරුදු 02 ක් පමණ කාලයක් වන බවත්, **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා

2023.03.14 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් කළ යෝජනාව අනුව සංශෝධන රහිතව සහා සම්මත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**(ආ).2025.06.11 දින පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.**

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

2025.06.11 දින පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද නොඑසේ නම් 2025.06.11 දින පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

06 වැනි පිටුවේ සඳහන් වැරදි තැන්වලදී විරුද්ධ වන බවත් ලෙස සටහන් වී ඇති බවත්, එය හොඳවැඩ වලට සහයෝගය ලබා දෙන ලෙස සටහන් විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

05 වැනි පිටුවේ සඳහන් 1997 වසරේ ආරම්භ වූ මාගේ දේශපාලන ගමන 2011 වසර දක්වාම ලෙස සටහන් වී ඇතත් එය 1997 වසරේ ආරම්භ වූ මාගේ දේශපාලන ගමනට වසර 17 ක් ලෙස නිවැරදි විය යුතු අතර ,සමන්ත රණසිංහ ලෙස සටහන් වී ඇත.එය දේශපාලනයේ හිටපු ගරු මන්ත්‍රීනි සමන්තා කරුණරත්න ලෙස නිවැරදි විය යුතු බවත්,07 වැනි පිටුවේ මන්ත්‍රීවරුන් සඳහා නිල මුද්‍රාවක් ලබාදෙන ලෙස සටහන් වී ඇත. එය මන්ත්‍රීතුමන්ලා සඳහා නිලමුද්‍රවක් හා හැඳුනුම් පතක් ලෙස සටහන් විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

06 වැනි පිටුවේ සඳහන් රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් කාන්තා නියෝජනය සඳහා තෝරාපත් ගැනිම සම්බන්ධයෙන් වල්ගම ජනතාවට ස්තුතිවන්ත වන ලෙස සටහන් වී ඇති අතර එය වල්ගම කොට්ඨාශයේ ජනතාවට හා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ස්තුතිවන්ත වන ලෙස නිවැරදි විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

06 වැනි පිටුවේ සඳහන් ඡන්ද 6333 ක් ලබාදී මන්ත්‍රීවරයකු වශයෙන් තෝරාපත් කර ගැනිම සම්බන්ධයෙන් රඹුක්කන ජනතාවට ස්තුතිවන්ත වන ලෙස සටහන් වී ඇතත් එය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සඳහා 6333 ක ඡන්ද ප්‍රමාණයක් ලබා දුන් රඹුක්කන ජනතාවට හා ගරු හිටපු සභාපති අතල හඳගම මැතිතුමා ඇතුළු කණ්ඩායමට ස්තූතිය ප්‍රකාශ කරන ලෙස නිවැරදි විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

06 වැනි පිටුවේ සඳහන් දෙවන වතාවටත් සභාවට තේරීපත් වීම සම්බන්ධයෙන් සතුටු වන අතර වැඩිම ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කලේ මා නිහතමානිව වැඩ කළ නිසයි. වෛරී දේශපාලනයෙන් තොර ඉදිරිගමනක් යමු.මෙම සභාව ලංකාවේ හොදම සභාව බවට පත් විය. නැවතත් ලංකාවේ හොදම සභාව බවට පත් කරමු. ලෙස සටහන් වී ඇති අතර එය රඹුක්කන ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ කඩිගමුව කොට්ඨාශය ඉතා වසනාවන්ත ඡන්ද කොට්ඨාශයක් වන අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් සිටීම සතුටු දායකයි.පසුගිය පළාත් පාලන මැතිවරණයේදී රඹුක්කන ඡන්ද බල ප්‍රදේශය තුළ එක්සත් ජාතික පක්ෂයට වැඩි ඡන්ද ලබා දෙමින් මා පළමු තැනට පත් කළ කඩිගමුව කොට්ඨාශයේ ජනතාවටත්,උඩුගම ගොන්දැවල ඡන්ද මධ්‍යස්ථානයෙන් මාහට N.N.P. පරදා වැඩි ඡන්ද 121 ක් ලබා දුන් උඩුගම ජනතාවටත්, විශේෂ ස්තුතිය පළ කරමි.මෙවැනි ජයක්ග්‍රහණයක් ලබා ගැනීමට හැකි වුයේ මා නිහතිමානිව වැඩකළ නිසාත්,වෛරී දේශපාලනයෙන් තොර ඉදිරිගමනක් ගොස් රඹුක්කන ප්‍රාදේශිය සභාව නැවතත් ලංකාවේ හොඳම ප්‍රාදේශිය සභාව බවට පත් කිරීමට අප සැමගේ සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරමි. ලෙස නිවැරදි විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය**

07 වැනි පිටුවේ සඳහන් කරුණ සදහා ඉදිරිපත් කළ විශේෂ කරුණු සටහන් වී නොමැති අතර ඒ සඳහා මා හට ඡන්දය ලබාදුන් කිරිවන්දෙණිය කොට්ඨාශයේ වසම් පහේ සියලුදෙනාටත්, රඹුක්කන කොට්ඨාශයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනතාවටත් ස්තුතිය පුද කරන බවට සදහන් විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

07 වැනි පිටුවේ සඳහන් නාමල් රාජපක්ෂ මැතිතුමා,අතුල හඳගම මැතිතුමා,තරංග මන්ත්‍රීතුමා ඇතුළු සියලුදෙනාටත්,රඹුක්කන ජනතාවටත් ස්තුතිය පුද කරන ලෙසය. එහි හිටපු සභාපති අතුල හඳගම මැතිතුමා ලෙසත්,රඹුක්කන කොට්ඨාශයේ පොදුජන පෙරමුණේ සියලුම ජනතාවට ස්තුතිය පුද කරන ලෙස සදහන් විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ආර්. කිත්සිරි සුමනරත්න මැතිතුමා**

07 වැනි පිටුවේ සඳහන් එම මන්ත්‍රීතුමාගේ ඉදිරිපත් කිරීමට තැපැල්කරුවෙකු වශයෙන් සේවය කළබව සදහන් වී නොමැති බැවින් එය සටහන් විය යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ආර්. කිත්සිරි සුමනරත්න මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පත්මසිරි මැතිතුමා**

04 වැනි පිටුවේ සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.ප.පත්මසිරි මැතිතුමා ලෙස සඳහන් වි ඇත.එහි 'ප' අකුර ඉවත් කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පත්මසිරි මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උප සභාපති ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

2025.06.11 දින පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කර ගැනීම සඳහා ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් කළ යෝජනාව අනුව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බව ගරු උප සභාපති ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.06.11 දින පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත වූ බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

(ඇ).සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදනය

**ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සබරගමුව පළාතේ පලාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ මහජන නියෝජිතයන් සඳහා පළාත් පාලන ආයතන වල මූලික නීතිය පිළිබඳ පුහුණු වැඩසටහනක් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ ප්‍රධානත්වයෙන් සහ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන නීති නිලධාරි,නීතිඥ පාලිත අභයවර්ධන මහතාගේ සම්පත් දායකත්වයෙන් පැවැත්වීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

❖ අන්තර්ගතය :-පළාත් පාලන ආයතනයක බලතල ,කාර්යය සහ කර්තව්‍ය සභා රැස්වීම් කටයුතු පවත්වාගෙන යාම,අරමුදලෙන් මුදල් වියදම් දැරීම සම්බන්ධ විධිවිධාන,අතුරු නීති පනවා ගැනීම අධීක්ෂණ ක්‍රියාවලිය ,සභාක දීමනා

❖ දිනය :-2025.06.21

❖ වේලාව :-පෙ.ව 08.30 සිට ප.ව 04.30 දක්වා

❖ ස්ථානය :-ග්‍රාම සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය,ගොමාඩුව,යටියන්තොට

මෙම පලාත් පාලන කොමසාරිස් විසින් යොමු කරක ලද ලිපිය ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදි.

**(ඇ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා - නැත**

(ඉ).සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම. -නැත

(ඊ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

(උ). යථාපරිදි කල්දී ඇති යෝජනා

උ.1. **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

**i.** 2025 වර්ෂය සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව ,නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව,කාර්මික සේවා කාරක සභාව,පරිසර හා පහසුකම් සැපයීමේ කාරක සභාව සහ ටෙන්ඩර් මණ්ඩලය සඳහා පහත සඳහන් වන පරිදි සභාපතිවරු හා සාමාජිකයින් පත් කිරීම සුදුසු බව යෝජනා කිරීම.

❖ මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව

ප්‍රාදේශිය සභා අරමුදලේ ආදායම් හා වියදම්ද, ඇතුළුව ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කීරීමට අදාලව ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම සඳහා හා ඊට අදාලව ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ පවරන බලතල හා කාර්යයන් ඉටු කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති කාරක සභාව නමින් යුත් කාරක සභාවක් විය යුතුය යන්න හා එම කාරක සභාවේ සංයුතිය පහත උපලේඛනයේ ආකාරයට වියයුතු බවටත්,යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 1. ගරු සභාපති | ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා | සභාපති |
| 2.ගරු උප සභාපති | ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා | සාමාජික |
| 3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා | සාමාජික |
| 4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ආර්.එස්.කුමාර රාමණායක මැතිතුමා | සාමාජික |
| 5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එම්.බී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා | සාමාජික |
| 6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එම්.එන්.මොහොම්බදු සුක්රි මැතිතුමා | සාමාජික |
| 7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා | සාමාජික |
| 8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය | සාමාජිකා |
| 9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඒ.ඒ.තරංග නුවන් ප්‍රසංග මැතිතුමා | සාමාජික |

<u>බාහිර පාර්ශවය</u>

| | | |
|---|---|---|
| 10.විශ්‍රාමික සහකාර කම්කරු කොමසාරිස් | - ජානක කුරුකොහුතැන්න මයා | සාමාජික |
| 11.ව්‍යවසායක | - ජගත් චාමික උදය කුමාර මයා | සාමාජික |
| 12. විශ්‍රාමික පොල් සංවර්ධන නිලධාරි | - ආර්.නිමල් වීරසිංහ මයා | සාමාජික |
| 13. ව්‍යාපාරික | - රුමි මොහොමඩ් | සාමාජික |

❖ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ නිවාස හා ඔවුන්ගේ සුබ සාධනය,සුබවිහරණය,සුවපහසුවද ඇතුළුව ඊට අදාළ ප්‍රජා කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට අදාලව ප්‍රාදේශීය සභාවට උපදෙස් දිම සඳහා හා ඊට අදාලව ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ පවරන බලතල හා කාර්යයන් ඉටු කිරිම සඳහා නිවාස සහ ප්‍රජා සංවර්ධනය කාරක සභාව නමින් යුත් කාරක සභාවක් විය යුතු ය. යන්න හා එම කාරක සභාවේ සංයුතිය පහත උපලේඛනයේ ආකාරයට විය යුතු බවටත්,යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | වයි.ජී.ජයවීර මැතිතුමා | සභාපති |
| 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | ඩබ්.එන්.එස්.සෝමදාස මැතිතුමිය | සාමාජිකා |
| 3.ගරු ප්‍රා දේශීය සභා මන්ත්‍රී | එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා | සාමාජික |
| 4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | වී.ආර්.ඊ.එන්.වීරබණ්ඩාර මැතිතුමිය | සාමාජිකා |
| 5.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී | එන්.ඒ.එස්.විමලරත්න මැතිතුමා | සාමාජික |
| 6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | ජී.ජී.මල්ලිකා මැතිතුමිය | සාමාජිකා |
| 7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා | සාමාජික |

<u>බාහිර පාර්ශවය</u>

| | | |
|---|---|---|
| 8.විශ්‍රාමික දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි (වෛද්‍ය රියාද් අද්මිරාල්) | වෛද්‍ය.ඩී.හේමචන්ද්‍ර කුලරත්න | සාමාජික |
| 9.ව්‍යාපාරික | භාෂිත දසනායක මයා | සාමාජික |
| 10.විශ්‍රාමික විදුහල්පති | එම්.ආනන්ද නිලමේ මයා | සාමාජික |
| 11.ව්‍යාපාරික | ඉන්දික කුඩාගම මයා | සාමාජික |
| 12.ව්‍යාපාරික | අජිත් සංජීව හෙට්ටිආරච්චි මයා | සාමාජික |

❖ කාර්මික සේවා කාරක සභාව

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන,ක්‍රියාත්මක කිරිමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති හා සභාවේ කාර්ය කටයුතු සිදු කිරිමේ දී අවශ්‍ය සියලු තාක්ෂණික කරුණු ද අතුළුව ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ බලතල ,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට අදාලව ප්‍රාදේශීය සභාවට උපදෙස් දිම සඳහා හා ඊට අදාලව ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ පවරන බලතල හා කාර්යයන් ඉටු කිරිම සඳහා කාර්මික සේවා කාරක සභාව නමින් යුත් කාරක සභාවක් විය යුතුය යන්න හා එම කාරක සභාවේ සංයුතිය පහත උපලේඛනයේ ආකාරයට වියයුතු බවටත්,යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 1. ගරු උප සභාපති | ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා | සභාපති |
| 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා | සාමාජික |
| 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එම්.ආර්.අයි.සමන් කුමාර මැතිතුමා | සාමාජික |
| 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා | සාමාජික |
| 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | කේ.සී.සරත් කුමාර මැතිතුමා | සාමාජික |
| 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය | සාමාජිකා |
| 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඒ.කේ.එම්.අනීස් මැතිතුමා | සාමාජික |

| | | |
|---|---|---|
| 8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.ජී.එන්.ප්‍රියන්ජිත් රාජපක්ෂ මැතිතුමා | සාමාජික |
| 9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා | සාමාජික |

<u>බාහිර පාර්ශවය</u>

| | | |
|---|---|---|
| 10.ඉංජිනේරු | අයි.වසන්ත ජයලත් මයා | සාමාජික |
| 11.ඉංජිනේරු | නිහාල් කොඩිතුවක්කු මයා | සාමාජික |
| 12.ඉංජිනේරු | ඩබ්.කේ.ඒ.එස්.චන්ද්‍රරත්න මයා | සාමාජික |
| 13.ව්‍යාපාරික | ඩී.පී.මීගාර පතිරණ මයා | සාමාජික |

❖ පරිසර හා පහසුකම් සැපයිමේ කාරක සභාව

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරසරයට අදාළ සියලු කටයුතු හා ජනතා සේවා සැපයිමේදී ජනතාවට අවශ්‍ය සියලු පහසුකම් ද ඇතුළුව ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කීරීමට අදාලව ප්‍රාදේශීය සභාවට උපදෙස් දිම සඳහා හා ඊට අදාලව ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ පවරන බලතල හා කාර්යයන් ඉටු කිරිම සඳහා පරිසර සහ පහසුකම් කාරක සභාව නමින් යුත් කාරක සභාවක් විය යුතුය යන්න හා එම කාරක සභාවේ සංයුතිය පහත උපලේඛනයේ ආකාරයට වියයුතු බවටත්,යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 1. ගරු උප සභාපති | ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා | සභාපති |
| 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එච්.අයි.ඩී.හත්තාගොඩ මැතිතුමා | සාමාජික |
| 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා | සාමාජික |
| 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ජේ.පී.පද්මසිරි මැතිතුමා | සාමාජික |
| 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමා | සාමාජික |
| 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ගාමිණි ධර්මසේන මැතිතුමා | සාමාජික |
| 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා | සාමාජික |
| 8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | වී.ආර්.එන්.බණ්ඩාරනායක මැතිතුමා | සාමාජික |

<u>බාහිර පාර්ශවය</u>

| | | |
|---|---|---|
| 9.මහජන සෞඛ්‍ය පරීක්ෂක | චරිත් කරුණාරත්න මයා | සාමාජික |
| 10.සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි | වෛද්‍ය අසංක මයා | සාමාජික |
| 11.වෛද්‍ය නිලධාරි | වෛද්‍ය රොෂාන් ජයකොඩි මයා | සාමාජික |
| 12.ව්‍යාපාරික | ලසන්ත වික්‍රමරත්න මයා | සාමාජික |
| 13. | ජේ.එම්.අයේෂා සංජීවනි සිල්වා මිය | සාමාජික |

❖ ටෙන්ඩර් මණ්ඩලය

| | | |
|---|---|---|
| 1. ගරු සභාපති | ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා | සභාපති |
| 2.ගරු උප සභාපති | ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා | සාමාජික |
| 3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා | සාමාජික |
| 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය | සාමාජික |
| 5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා | සාමාජික |
| 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා | සාමාජික |
| 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා | සාමාජික |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මුද්‍රණ දෝෂයක් නිසා මෙම කමිටුවල සංශෝධය කිරිම ඇති බව ප්‍රකාශ කරන ලදි.ඒ අනුව කාර්මික සේවා කාරක සභාවේ සභාපති ලෙස ගරු ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමාගේ නම සටහන් වී ඇත.එහි සභාපති ලෙස ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විය යුතු බවත්,ගරු උපසභාපති

ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා සාමාජික ලෙස සංශෝධනය විය යුතු බවත්, පරිසර හා පහසුකම් සැපයිමේ කාරක සභාවේ ගරු උප සභාපති ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා සාමාජික ලෙස සටහන් වී ඇත.එය සභාපති ලෙස නිවැරදි විය යුතු බවත්,අංක 03 යටතට සාමාජික ලෙස ගරු ප්‍රාදේශිය මන්ත්‍රී ගාමිණි ධර්මසේන මැතිතුමා ලෙස සටහන් වී ඇත.එය ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා ලෙස නිවැරදි විය යුතු බවත්, ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි. පරිසර හා පහසුකම් සැපයිමේ කාරක සභාව සඳහා අලුතින් ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.එම්.ගාමිණි සමරකෝන් මැතිතුමා හා ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමාගේ නම් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා

කාරක සභා කමිටු සඳහා බාහිර පුද්ගලයින් පත් කිරිමට විරුද්ධ වීමට හේතුව ජනතා නියෝජිතයින් වශයෙන් අප පත් කර ඇත්තේ ජනතා ඡන්දයෙන්ය. එසේ ජනතාව අපව එවා ඇත්තේ මෙම තීන්දු තීරණ ගැනිමටය.මා හිතනවා විශ්වාස කරනවා ගරු සභාපතිතුමා අදක්ෂයෙක් නොවන බවත්,පරිපාලන කටයුතු කර ගෙන යාමට ඔබතුමාට හැකියාවක් ඇති බවත්,මෙය ඉතිහාසයේ නොකරපු දෙයක් බැවින් මෙම බාහිර පුද්ගලයන් හඳුන්වා දෙන ලෙසය.පනතේ ප්‍රතිපාදන තිබුණත් බාහිර පුද්ගලයින් කවුරුන්ද යන්න හඳුන්වා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

❖ ගරු ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

බාහිර පුද්ගලයන් ඇතුළත් කර ගැනිම සඳහා පනතේ ප්‍රතිපාදන පවතින බැවින් මා ලසු වීමට අකමැති බවත් ,අප බලයට පත් විමෙන් පසු දැකපු දෙයක් අප නිවැරදි විය යුතු අපව නිවැරදි කිරිමට ජනතාවට හැකියාවක් ඇත. මේ රටේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමට, සැකසීමට අපට හැකියාව ඇති නමුත් බාහිර පුද්ගලයින් සම්බන්ධ කර ගැනිමෙන් එය වඩාත් විධිමත්ව කිරිමට හැකිබව පවසන ලදි. එසේම බාහිර පුද්ගලයන්ගෙන් අපගේ අභිමානයට,මන්ත්‍රී භූමිකාවට කැලැල්ලක් නොවන පරිදි කටයුතු කිරිමට වගබලා ගන්නා බවට පොරොන්දු විය.ඉන්පසු බාහිර පුද්ගලයින් හඳුන්නා දීම සිදු කරන ලදි.

❖ **මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව**

<u>බාහිර පාර්ශවය</u>

**1.විශ්‍රාමික සහකාර කම්කරු කොමසාරිස් - ජානක කුරුකොහුතැන්න මයා**

මොහු කැගල්ල දිස්ත්‍රික්කයේ හිටපු සහකාර කම්කරු කොමසාරිස්වරයෙක්,දේශපාලන ක්‍රියාකරුවෙක්,හොඳ රාජ්‍ය නිලධාරියෙක් ලෙස හඳුන්වා දෙන ලදි.

**2.ව්‍යවසායක - ජගත් චාමික උදය කුමාර මයා**

මොහු හොඳ ව්‍යවසායකයෙක් ,මරයින් තාක්ෂණය පිළිබඳ ලංකාවේ සිටින විශේෂඥයෙක් ලෙස හඳුන්වා දෙන ලදි.

**3. විශ්‍රාමික පොල් සංවර්ධන නිලධාරි - ආර්.නිමල් වීරසිංහ මයා**

මොහු හොඳ ව්‍යවසායකයෙක්,දක්ෂ රාජ්‍ය නිලධාරියෙක් ,කර්මාන්තකරුවෙක් ලෙස හඳුන්වා දෙන ලදි.

**4. ව්‍යාපාරික - රූමි මොහොමඩ් මයා**

මොහු හොඳ ව්‍යවසායකයෙක්,ධානාත්මක මට්ටමේ පුද්ගලයෙක් ලෙස හඳුන්වා දෙන ලදි.

❖ **නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව**

<u>බාහිර පාර්ශවය</u>

**1.විශ්‍රාමික දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි - වෛද්‍ය.ඩී.හේමචන්ද්‍ර කුලරත්න (වෛද්‍ය රියාද් අද්මිරාල්)**

මොහු නාවික හමුදාවේ හිටපු වෛද්‍යවරයෙක් ,මහජන යහපත උදෙසා කටයුතු කරන පුද්ගයෙක් බව හඳුන්වා දෙන ලදි.

**2.ව්‍යාපාරික - භාෂිත දසනායක මයා**

මොහු හොඳ ව්‍යවසායකයෙක්,ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා අදහස් ලබා ගැනිමට හැකියාවක් ඇති පුද්ගයෙක් බව හඳුන්වා දෙන ලදි.

**3.විශ්‍රාමික විදුහල්පති - එම්.ආනන්ද නිලමේ මයා**

මොහු කොටවැල්ල පාසලේ විදුහල්පති ,ඔහු අබාධිතයෙක් වුවත් අති දක්ෂයෙක් ඔහුට අවස්ථාවක් ලබා දියයුතු බව ප්‍රකාශ කරමින් හඳුන්වා දෙන ලදි.

**4.ව්‍යාපාරික - ඉන්දික කුඩාගම මයා**

මොහු ද පාපන්දු ඇකඩමියක් කරගෙන යන සමාජ සංවර්ධන කටයුතු වලට සහයෝගය ලබාදෙන පුද්ගයෙක් බව හඳුන්වා දෙන ලදි.

**5.ව්‍යාපාරික - අජිත් සංජීව හෙට්ටිආරච්චි මයා**

මොහු සමාජ සේවා කටයුතු වලට සහයෝගය ලබාදෙන පුද්ගයෙක් බව හඳුන්වා දෙන ලදි.

❖ **කාර්මික සේවා කාරක සභාව**

මෙහි කාර්මික සේවාවේ හිගයක් පවතින බවත් ඒ සඳහා බාහිර පාර්ශවයෙන් උදව් ලබා ගැනිමට හැකිවේ යැයි සිතන බව පවසන ලදි.

<u>බාහිර පාර්ශවය</u>

**1.ඉංජිනේරු - අයි.වසන්ත ජයලත් මයා**

දක්ෂ ඉංජිනේරුවෙක් බව හඳුන්වා දෙන ලදි.

**2.ඉංජිනේරු - නිහාල් කොඩිතුවක්කු මයා**

මොහු ජල සම්පාදන මණ්ඩලයේ විශ්‍රාමික ඉංජිනේරුවරයෙක් ඒ නිසා රඹුක්කන පවතින ජල ප්‍රශ්නය විසදා ගැනිමට උදව් ලබා ගතහැකි බව ප්‍රකාශ කරමින් ඔහු හඳුන්වා දෙන ලදි.

**3.ඉංජිනේරු - ඩබ්.කේ.ඒ.එස්.චන්ද්‍රරත්න මයා**

මොහු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂතුමා,දැනටමත් නගර සම්බන්ධව සැලසුමකට කමිටුවක් සකස් කර ඇත.එය ක්‍රියාත්මක වෙමින් පවති. එම කමිටුවේද මෙතුමා නියෝජනය කරනු ඇත. එම නිසා උදව් ලබා ගතහැකි බව ප්‍රකාශ කරමින් ඔහු හඳුන්වා දෙන ලදි. ඔවුන් පත් කරන්නේ අපට උදව් ලබා ගැනිමට මිස බලපෑම් කිරිමට නොවන බව ගුරු සභාපතිතුමා වැඩිදුරටත් දන්වා සිටි.

**4..ව්‍යාපාරික - ඩී.පී.මීගාර පතිරණ මයා**

රඹුක්කන ව්‍යාපාරිකයෙක් ,එතුමා මෝටර් රථ වාහන සම්බන්ධයෙන් යම් දැනිමක් ඇති පුද්ගලයෙක් අප ආයතනයේ රථ වාහන පවතින බැවින් ඒ දැනුම උපකාර කර ගැනිමට හැකිබව පවසන ලදි.

❖ **පරිසර හා පහසුකම් සැපයිමේ කාරක සභාව**

<u>බාහිර පාර්ශවය</u>

**1.මහජන සෞඛ්‍ය පරීක්ෂක - චරිත් කරුණාරත්න මයා**

රඹුක්කන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක්,පරිසරය පිළිබඳ හොඳ අවබෝධයක් ඇති පුද්ගයෙක් බව හඳුන්වා දෙන ලදි.

**2.සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - වෛද්‍ය අසංක මයා**

මොහු රඹුක්කන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා ,එතුමා පසුගිය කාලවලදී පරිසර සම්බන්ධ ගැටලු වලදී උදව් ලබාදී ඇත.ස්වේඡාවෙන් කටයුතු කරන පුද්ගලයෙක් බව හඳුන්වා දෙන ලදි.

**3.වෛද්‍ය නිලධාරි - වෛද්‍ය රොෂාන් ජයකොඩි මයා**

මොහු ද රඹුක්කන ප්‍රදේශයේ දක්ෂ වෛද්‍යවරයෙක් බව හඳුන්වා දෙන ලදි.

**4.ව්‍යාපාරික - ලසන්ත වික්‍රමරත්න මයා**

මොහු දක්ෂ ව්‍යවසායකයෙක්,සම්පත්දායකයෙක් බව හඳුන්වා දෙන ලදි.

**5.ජේ.එම්.අයේෂා සංජීවනි සිල්වා මිය**

මෙම මහත්මිය ද සුදුසුකම් ඇති නිලධාරිනියක් නිසා මෙයට ගැලපෙන බව හඳුන්වා දෙන ලදි.

කාරක සභා කමිටුවල බාහිර පාර්ශවයන් හඳුන්වා දී මෙන් පසු මොවුන් අපට උදව් කරන්නේ මෙම කමිටුවල ගුණාත්මක භාවය වැඩිදියුණු කර දීමට හා බොහෝ විට හොඳ යෝජනා ඇතුළත්ව ගුණාත්මක බව වැඩි කිරිමට බලාපොරොත්තු වන බවත්,පැහැදිලි කිරීම් ප්‍රමාණවත් ද යනුවෙන් මන්ත්‍රීතුමන්ලා වෙත ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා පවසන ලදි.

- **ගරු ප්‍රාදේශිය මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතමනි,පත් කිරීම් ගැන මාගේ විරෝධතාවනක් නොමැති බවත්,මේ ප්‍රදේශයට ආදරය කරන වැඩ සඳහා උදව් කරන පුද්ගලයින්, ඒ වගේම අසන්නට ලැබුණා ඔබතුමාගේ දේශපාලන පක්ෂය නියෝජනය කළඅය බවට කමිටුවේදී එය නොකරයි කියලා විශ්වාස කරනවා යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයා ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ මොහොමඩ් අනීස් මැතිතුමා**

ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් කළ යෝජනාව අනුව සංශෝධනයන්ට යටත්ව 2002.06.11 වන දින පැවති විශේෂ මහ වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

තීරණය -

අදාළ කමිටු සඳහා පත්කළ මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා සභාපතිවරයන් හා සාමාජික,සමාජිකාවන් ලෙස අනුමත කිරිමට තීරණය විය.

**(උ)2. ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

**I** .මන්ත්‍රීතුමන්ලා සඳහා මන්ත්‍රී නිලමුද්‍රව සකස් කිරිම ,හැඳුනුම් පත් සකස් කිරිම හා ලිපි ශීර්ෂ පිටපත් 25 ක් සහිත පොතක් මුද්‍රණය කිරිමට සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු උප සභාපති ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

මන්ත්‍රී නිලමුද්‍රව සකස් කිරිම ,හැඳුනුම් පත් සකස් කිරිම හා ලිපි ශීර්ෂ පිටපත් 25 ක් සහිත පොතක් මුද්‍රණය අනුමත කිරිමට තීරණය විය.

ii. මාස තුනකට යටත්ව ආයුර්වේද වෛද්‍යතුමියගේ සේවය ලබා ගැනීමට සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ආයුර්වේද වෛද්‍යතුමියගේ සේවය ලබා ගැනීම අනුමත කිරීමට තීරණය විය.

iii.මාසික සභා රැස්වීමේ පසුබිමට බැනරයක් සවි කිරීමට සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ මොහොමඩ් අනීස් මැතිතුමා**

මාසික සභා රැස්වීමේ පසුබිමට බැනරයක් සවි කිරීම කරන අතරම ප්‍රාදේශීය සභා තුන් මහල් ගොඩනැගිල්ල සඳහා විදුලිය නිසියාකාරව නොමැති බැවින් වර්ෂාව ඇති වූ විට අප සියලුදෙනාමට අඳුරේ සිටීමට සිදුවන නිසා එම ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීමට වැඩපිළිවෙක් යෙදීම සුදුසු බවට යෝජනා කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහෙමඩ් අනීස් මැතිතුමා විසින් කළ ප්‍රාදේශීය සභා තුන් මහල් ගොඩනැගිල්ල සඳහා විදුලිය නොමැති බවට කළ යෝජනාව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පිළිගන්නා බවට ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
බැනරයක් සකස් කිරීමට අනුමත කිරීම තීරණය විය.

iv.මාසික සභා රැස්වීම මහජනයාට විවෘත කිරීම සුදුසු බවට යෝජනා ගරු සභාපති අර්.එම්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මෙම මහජන ගැලරිය සකස් කිරීම සිදු කරන්නේ කොහෙද,එයට නියෝජනය කරන්නේ කවුරුන්ද යන්න පිළිබඳව විස්තරයක් කරන ලෙස පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මහජන ගැලරිය මාසික මහ සභාව පවතින මෙම ස්ථානයේ සැදීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මහජන ගැලරිය විවෘත කිරීමට විශේෂ යෝජනාවක් ලබා ගැනීමට පනතේ ඇති බව පෙන්වා දෙන ලදි.එම නිසා විශේෂ අවසරයක් ලබාගෙන සිදු කිරීම හා සංඛ්‍යාවක් තීරණය කිරීම සුදුසු බවට පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමාගේ අදහස් ප්‍රකාශයට ස්තුතිවන්ත වන අතර මහජන ගැලරිය සඳහා 50 ක සීමා වන ලෙස සංඛ්‍යාව තීරණය කිරීම සුදුසු බවට පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මහජන ගැලරිය සඳහා 50 සීමාව වැඩි බවත්,40 ක් පමණ සුදුසු බව හා පනතේ අනුමැති ඇති බවත්, මහජන ගැලරිය පාසල් දරුවන් ඇතුළත් කිරිම හා මන්ත්‍රීතුමන්ලා 37 ක් සිටින අතර එම 37 දෙනාගෙන් එක් පුද්ගලයෙකු බැගින් සහභාගි කරවා ගැනිමටත්,සුදුසු බවට පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

මහජන ගැලරිය සඳහා සංඛ්‍යාව අගය ප්‍රශ්නයක් නොවන බවත්,මේ සඳහා ජනතාව දැනුවත් කිරිම කළයුතු බව ප්‍රකාශ කරන අතර එක්තරා අවස්ථාවක මා පැමිණි විට වසා තිබිම නිසා ඇතුළු විමට ඉඩකඩ නොමැති විය.ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරමි.හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත රණසිංහ මැතිතුමා ඒ පිළිබඳ කරුණු ප්‍රකාශ කළ බවත්, පාසල් ළමුන්ගේ පැමිණිමට මාගේ අකමැත්තක් නොමැති බව ප්‍රකාශ කරමි.පනතේ විධිවිධාන අනුව පාසල් ළමුන් සඳහා ගරු සභාපතිතුමන්ගේ අවරසරය ඇතුව ඉඳහිට බැලිමට අවස්ථාව සලසා දිම සිදුකිරිමත්,ඒ වගේම ගැලරියේ වැදගත්කම තමන්ගේ කොට්ඨාශයේ අලුත් යෝජනා,සැලැස්මන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනිමට හැකි විමය.මා ඉල්ලිම් කරන්නේ පාසල් ළමුන් යෞවන සමාජ,ක්‍රිඩා සමාජ නියෝජනය කිරිමට අවස්ථාව ලබාදෙන ලෙසය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමා දැනුවත් කර අවසරය ලබාගෙන මාසික මහ සභා රැස්වීම්ට සහභාගි විය හැකි බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ මොහොමඩ් අනීස් මැතිතුමා**

ගරු සභාපතිතුමාගෙන්ද,මන්ත්‍රීතුමන්ලාගෙන්ද,ලේකම්තුමාගෙන් හා කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ගැලරිය මහජනතාවට විවෘත කිරිම හොඳ බවත්,මහජන නියෝජිතයන් සඳහා එම වරම ලබාදෙන ලෙසත්, යෝජනා අදහස් ප්‍රකාශ කිරිමේදී ගැටලු වලට පත් නොවන ලෙස ගරු සභාපතිවරයා වගකිව යුතු බවත්,මෙහි රහස්‍යභාවය තිබිය යුතුය.පාසල් සිසුන් දෙදෙනෙකු හා සියලුම මන්ත්‍රී සමාජිකයින් දෙදෙනෙකු දැම්මට අවසර දෙන ලෙස යෝජනා කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මම යෝජනා කරනවා පාසල් ළමුන් දෙදෙනෙකුත්,මන්ත්‍රී මණ්ඩලයේ නියෝජනය කරන 37 දෙදෙනා එක් අයෙකු සමඟ උපරිමය 50 ට යටත්ව ලබාදිම සුදුසු බවත්,විවෘත කිරිමේදී අපගේ හැසිරිම මහජනතාවට අප්‍රිය වේයැයි නොසිතන අතර මන්ත්‍රීතුමන්ලාගේ නිර්දේශය මත එක් මාසික මහසභා රැස්විමට මහජනතාවට විවෘත වන්නේ 50 දෙනෙකු හට පමණක් බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමාගේ අවසරය ඇතුව පැමිණිමට සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මහජන ගැලරියට පැමිණිමට අවසර ලබා ගැනිම මන්ත්‍රී නිර්දේශය යටත්ව සතියකට කලින් එවීම සිදුකළ යුතු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

මහජනතාව රැඳිසිටිය යුතු කාලය පිළිබඳ දැනුවත් කිරිමක් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මහජන ගැලරිය සඳහා පැමිණෙන සියලුම මහජනතාව ආරම්භයේ සිට අවසානය දක්වා රැඳිසිටිය යුතු බවත්,අතර මඟදී යාමට ඉඩ දුන්නොත් අපගේ රැස්වීමට බධාවක් සිදු වන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මහජන ගැලරියේ සිටිය යුතු ආකාරය, පැමිණිට ,පිටවීම වැනි කරුණු ඇතුළත් කර උපදෙස් පත්‍රිකාවක් සකස් කර පැමිණෙන මහජනතාවට ලබා දෙන ලෙස ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මහජන ගැලරිය සඳහා උපදෙස් පත්‍රිකාවක් දැමීම සඳහා කැමති බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
එක් මාසික මහසභා රැස්වීමක් සඳහා මහජන ගැලරිය සඳහා 50 ක ප්‍රමාණයක් අනුමත කිරිම තීරණය විය.

v. පහත සඳහන් කාර්යන් සඳහා වන ගාස්තු සංශෝධනය කිරිම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්. බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ මොහොමඩ් අනීස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. ජල නල එලිමට සඳහා මාර්ගය පළුදු කිරිම .
ii. ක්‍රිඩාපිටි වෙන් කිරිම. (ක්‍රිඩාංගන/සැණකෙලි/වෙළඳ ප්‍රදර්ශන)
iii.සුසාන භූමියේ අදාහන හා මෘතදේහ මිහිදන් කිරිම.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ජල නල එලිමට සඳහා මාර්ගය පළුදු කිරිම, ක්‍රිඩාපිටි වෙන් කිරිම, සුසාන භූමියේ අදාහන හා මෘතදේහ මිහිදන් කිරිම සඳහා මිල ගණන් සංශෝධනය කිරිමේදී මිල ගණන් අඩු කිරිමක් කරනවාද එසේ නොමැති නම් වැඩි කිරිමක් සිදුකරනවාද යන්න ප්‍රකාශ කරන ලදි. එසේ වැඩි කරන්නේ නම් අවශ්‍ය ගණන කමිටු රැස්වීමේදී තීරණය කිරිමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මට හැගෙන පරිදි පරණ මිල ගණන් වලට පවතින බවත් මා හට මේ පිළිබඳ ලොකු අවබෝධයක් නොමැති බවත් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

ආදාහනාගාරයේ ගාස්තු වැඩි කිරිම සිදු කරන්නේ නම් ඒ පිළිබඳ අවදානය යොමු කර තවටිකක් කල්පනා කර බැලීම හොඳ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා විසින් ප්‍රකශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

යෝජනා අංක 05 අනුඅංක i ,ii, පිළිබඳ මා හට ප්‍රශ්නයක් නොවන බවත්,ආදාහනාගාරයේ මිල සංශෝධනය සඳහන් තුන්වන කරුණ ගැන සලකා බලා ආදාහනාගරයේ ගණන් වැඩි කිරිම පිළිබඳ අවදානය යෙමු කිරිම ඉතා හොඳ බවත්, කමිටු බලය හා දිස්ත්‍රික්කයේ අනෙකුත් අදාහනාගාර කටයුතු

සඳහා පවතින මිල ගණන් ගැන බලා තීරණය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ඔබතුමාලාගේ මංගල සභා රැස්වීමේදීම මෙම ගාස්තු වැඩිකිරීම සුදුසු නැති බව ප්‍රකාශ කරන ලදි.ජනතාවගේ බදු මුදල් අඩු කිරීම තේමා කර ගෙන ජනතාවට පොරොන්දු ලබා දී ජනතාවට සේවය කරන්නේ නම් මෙම ගාස්තු සංශෝධන කිරීම කාලෝචිත නොවන බව ප්‍රකාශ කරන අතර ජලනල එලීම සඳහා මාර්ගය පළුදු කිරීමේදී ජනතාවගේ එදිනෙදා කටයුතුත්තක් වන බැවින් මිල සංශෝධනය කිරීම සුදුසු නොවන බවත්,එය වැඩි කරන ආකාරය පිළිබඳ සඳහන් කිරීමත්,ක්‍රීඩාපිටි වැඩි ප්‍රමාණයක් පාසල් ළමුන් සඳහා යොදා ගන්නා බවත්,සුසාන භූමියේ මෘතදේහ මිහිදන් කිරීමේ කටයුතු සඳහා රු1000.00 ක් අතර ප්‍රමාණයකට වැඩි කිරීම සුදුසු බවත්,ප්‍රකාශ කරන ලදි.මෙය ජනතාවට සේවා සපයන ආයතනයක් වන බැවින් මිල ගණන් වැඩිකිරීම සුදුසු නොවන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ඔබතුමන්ලාගේ මංගල සභා වාරයේදීම පළමුව සපයන සේවා සඳහා මුදල් වැඩි කිරීමට ඉදිරිපත් කර ඇත.ක්‍රීඩාපිටි තුළ අවශ්‍ය පහසුකම් අඩු මට්ටමක ඇති බවත්,අදාහනාගාරය සඳහා දැනට පවති ගාස්තුවත් සාමන්‍ය ජනතාවට දරාගැනිමට නොහැකිව ඇත.එම නිසා පරණ මිල ගණන් වලට සභාවේ අනුමැතිය තීරණය කිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම සේවා ගාස්තු වැඩිකිරීම සභාවේ අරමුදල් වැඩිකර ගැනිම හා මහජනතාව පීඩාවට පත්කිරීමට නොව අපට ජලනල එලීමේදී මාර්ගය පළුදු කිරීමේදී ලබා ගන්නා රු2000.00 ක මුදලින් මාර්ගය යථාතත්වයට පත්කළ නොහැකි වීමෙන් මාර්ගවල වලවල් සෑදී ඇත.එම නිසා අනතුරු සිදුවීමේ ප්‍රවනතාවය වැඩි බව මා සහභාගිවූ පොලිස් දොපර්තමේන්තු රැස්වීමක දි පොලිස් මාර්ග අංශයේ ස්ථානාධිපතිවරයා සඳහන් කරන ලද.ප්‍රාදේශීය සභාවේ අපිටත් වගකිමක් ඇත එම මාර්ග නිසිපරිදි යථාත්තවයට පත් කිරීම සම්බන්ධව මුදල් හා ප්‍රතිපත්ති සැකසිමේ කාරක සභාවට ද අදහස් දැමීමට යෝජනා කරන අතර මෙය සංශෝධන කිරීමට ඔබතුමන්ලාගේ යෝජනා අදහස් තියෙනවා නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මාර්ග ඇප සඳහන් කරනවා නම් රු2000.00 ඇප කරයක් සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

මෙම ප්‍රාදේශීය සභාව බැදිලා සිටිනවා මාර්ග සකස් කර දීමට එහෙත් මාර්ගයේ කැඩීම් සිදුකර ඒවා නිසි පරිදි සකස් නොකර පස් යොදා පුරවා ඇති බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සඳහා සියලුමදෙනාගේ යෝජනා ලබා දෙන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ කම්ටු සඳහා යොමු කර මිල ගණන් අනුමත කිරීමට තීරණය විය.

vi. සෞඛ්‍ය හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් හට නිල ඇඳුම් සහ ආරක්ෂිත අයිතම් ලබා දිම නිසි ටෙන්ඩර් පරිපටියක් අනුගමනය කරමින් ක්‍රියාත්මක කිරිම සුදුසු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජ්.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි කසල එකතු කිරිම හා කුණු ප්‍රශ්නය එය අනාරක්ෂිතව තමයි කරගෙන යාම සිදු කරන්නේ බෝතල් කටු කුණු වලට දැමීම තහනම් කරත් මහජනතාව එය සිදු කරයි. ආරක්ෂිත නිල ඇඳුම් සහ ආරක්ෂිත ආයිතම් ලබාදුන්නත් ඒවායේ කුමන හෝ අඩුපාඩු පවතී.ආරක්ෂිත පාවහන් නැත,ගැළපෙන ආකාරයට අත්වැසුම් නැත.මෙවැනි දේවල් නිසියාකාරව ඔවුන්ට ලබා දිය යුතුය. ඔවුන් ආරක්ෂා වී සිටින්නේ නම් පමණයි අපට නගරය පිරිසිදු කර ගැනිමට හැකිවන්නේ යැයි ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

සෞඛ්‍ය හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් හට නිල ඇඳුම් සහ ආරක්ෂිත අයිතම් ලබා දිම නිසි ටෙන්ඩර් පරිපටියක් අනුගමනය කරමින් ක්‍රියාත්මක කිරිම අනුමත කිරිමට තීරණය විය.

උ.3.i. **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා**

කවුඩාඋල්ල ගල්පොළ මාර්ගය සංවර්ධන කිරිම හා කවුඩාඋල්ල ගල්පොළ මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ සංවර්ධන යෝජනාව අනුමත කිරිමට තීරණය විය.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඊ ළඟ යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

උ.3.ii. **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

කොන්ගස්හන්දිය සිට කුරුදුවත්ත මාර්ගයේ ගමන් කිරිමට අපහසු වලවල් සෑදි ඇති ස්ථානවලට ගල් පස් යොදා සංවර්ධන කිරිම, දුනුකේවල කපුරුගොල්ල මාර්ගය සංවර්ධන කිරිම හා ප්‍රාදේශීය සභාවට අයත් මාරුක්වතුර සමිති ශාලාවේ ඉතිරි කොටස සංවර්ධන කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

ප්‍රාදේශිය සභාවට අයත් ඉඩමක පසුගිය ප්‍රාදේශිය සභා කාලයේ මාරුක්වතුර සමිති ශාලාව ඉදිකර එහි කොටසක් නිම කර ඇත.එහි තවත් කොටසක් ඉදිකිරිමට නියමිතව ඇත.මෙම සමිති ශාලාව ප්‍රාදේශීය

සභාවට අයිති ඉඩම ඉදිකර ඇති බැවින් එහි ඉතිරි කොටස සංවර්ධන කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ඉහත සඳහන් සංවර්ධන යෝජනා කිරිමට අනුමත කිරිම තීරණය විය.

උ.3.iii.B.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමරවල දොරවල් දිරාපත් වීමෙන් වෙළඳ මහතුන් දැඩි අසිරුතාවකට පත්ව ඇති නිසා හැකි ඉක්මනින් දොරවල් සවිකිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ මොහොමඩ් අනීස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමා විසින් ආයුර්වේද වෛද්‍යතුමිය ලබා ගැනිමට යෝජනා කළ නිසා මාගේ පළමු යොජනාව ඉල්ලා අස්කර ගැනිම කැමති බව ප්‍රකාශ කරන ලදි. පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමරවල දොරවල් දිරාපත් වීමෙන් වෙළඳ මහතුන් දැඩි අසිරුතාවකට පත්ව ඇත.මෙම කඩකාමරවල කොටස පමණක් සවි කිරිමට ඇති බවත්.දොරවල් සවිකිරිමට ඇති කඩකාමර කිහිපය සොයා බලා ඉතා කඩිනමින් සිදු කිරිම කළයුතු බව ප්‍රකාශ කරන ලදි.අප සභාවෙන් කෙරෙන්නේ වරිපනම් එකතු කිරිම හා ගෙවීම් කිරිම ප්‍රමාද වුවහොත් 10% ක දඩමුදලක් අයකර ගැනිම සිදු කරනු ලබයි.එම නිසා මෙහි දොරවල් සකස් කිරිමේ කටයුතු හැකි ඉක්මනින් කර ගැනිම හැකියාවක් ඇති බැවින් මේ සඳහා කඩිනමින් වැඩපිළිවෙලක් යොදන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ මොහොමඩ් අනීස් මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා කළ යෝජනවට මටත් වචන සුවල්පයක් අවසර ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි. ගරු සභාපතිතුමනි,මට මෙම ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති බැවින් ව්‍යාපාරිකයන්ගේ ගැළුලු පිළිබඳ අවබෝධයක් ඇත.ව්‍යාපාරිකයින් විසින් ලොකු ටෙන්ඩර් දමා මෙම කඩකාමර බදු ගෙන ඇත.එහෙත් එම කඩකාමරවල වහල කඩාවැටී ඇති බවත්,දොරවල් දිරාපත් වී ඇති බවත් ව්‍යාපාරිකයන් විසින් දන්වා ඇත.මහජන නියෝජිතයින් වශයෙන් අප තෝරාපත් වී ඇත්තේ ජනතාවට සහනයක් ලබා දිම හා මෙවැනි දේවල් ගැන සොයා බලා හොඳ වැඩ පිළිවෙලක් කිරිමටය.ව්‍යාපාරිකයන්ගෙන් ලොකු මුදලකට ටෙන්ඩර් අරගෙන කඩකාමර විවෘත කිරිම සිදු වී ඇති බව පවසන ලදි. එම නිසා මම විශේෂයෙන් ඉල්ලීම් කර සිටින්නේ එස්.පී.ආර්.අනුර පියරත්න මන්ත්‍රීතුමා පැවසූ ආකාරය යම්කිසි වැඩපිළිවෙක් ඉදිරියේදී කිරිම හොඳ බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ මොහොමඩ් අනීස් මැතිතුමා ප්‍රකශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමාගේ ඉදිරිපත් කිරිමේදී වරිපනම් නොව කඩකුලී ලෙස සංශෝධනය විය යුතු බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ඉහත සඳහන් සංවර්ධන යෝජනා කිරිමට අනුමත කිරිම තීරණය විය.

**උ.3.iv.A. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
දැලිවල තිස්ස මාර්ගය දැඩි අබලන් වී ඇති බැවින් එම මාර්ගය පිළිසකර කිරිමට සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ඉදිරිපත් කළ එම යෝජනාව මා 2024.12.19 දින ලේකම්තුමා වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කර ඇත.දැලිවල කඩමණ්ඩියේ සිට මිරිහාගොඩ දක්වා මාර්ගයේ ත්‍රීවිල් දෙකක් යන විට පාරේ යන මගින්ට ඉවත් වී ඉඩ ලබා දිමට නොහැකි තත්වයක පවති.ඒ වගේම පයින් ගමන් කිරිමටවත් නොහැකි ලෙස අබලන් වී ඇත.එම මාර්ගයේ දැලිවල මහ විද්‍යාලයට,දැලිවල තිස්ස ප්‍රාථමික විද්‍යාලයට,රිවෝන් පෙර පාසලට පාසල් සිසුන් හා කුඩා දරුවන් රැගත් බස්රථ 05 ක ප්‍රමාණයක් දිනකට ධාවනය වීම සිදුවේ.එම නිසා මා මෙම යෝජනාව ඉදිරිපත් කළ අතර ඒ සම්බන්ධව ලේකම්තුමාගේ 2025.01.27 දින පිළිතුරු ලිපියෙන් මා දැනුවත් කර ඇත.එම ලිපියේ සඳහන්ව ඇති ආකාරයට කාර්මික නිලධාරිතුමා එම ස්ථානයට ගොස් ස්ථානීය පරීක්ෂාවක් සිදුකර තිබිමත්,මැනුම් කටයුතු කර ඇති බවත්,2025 වර්ෂයේ සංවර්ධන යෝජනාවක් ලෙස පළාත් සභාවට ආසන්න වශයෙන් මිලියන 100 ක ඇස්තමේන්තුවක් සමඟ ඉදිරිපත් කර ඇති බවත්,දන්වා ඇත. ඉන්පසු අපගේ සභාව විසුරුව හැරිමත් සමඟ සභාවේ වැඩ කටයුතු ලේකම්තුමාට පැවරිනි.මේ සම්බන්ධව ප්‍රමුඛතාවයක් ලබා ගැනිම සුදුසු බවත්,මෙහි පාසල් බස්රථ ඉතා අනාරක්ෂිත ලෙස ධාවනය වන බැවින් අබලන්ව පවතින මෙම මාර්ගය සංවර්ධන කටයුත්ත පිළිබඳ ගත් ක්‍රියාමාර්ග ගැන දැන ගැනිමට කැමති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් කරුණු දැක්විම පිළිබඳව මම එස්.එම්.ගාමිණී සමරකෝන් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන අතරම එතුමා ලිපියක් ඉදිරිපත් කර අවසානයේදී ඒ සඳහා මිලියන 100 ක ආසන්න මුදලක් මෙම මාර්ගය සඳහා යෙදීම සහයෝගය දුන්නට ඒ වගේම මම සඳහන් කරන්න අවශ්‍යයි අපි ගියවර සභාවේ දිවුරුම් දෙන අවස්ථාවේදී පළමුවෙන්ම සභාපතිතුමාට පැවසුවේ මෙමෙ මාර්ගයේ කඩතොළු ශ්‍රමදායකත්වයෙන් මා මුදල් යොදවා පිළිසකර කරමු යැයි යෝජනා කරන ලදි. ඒ වගේම එම පිළිසකර කරපු තැන් තමා නැවතත් කඩතොළු වේලා පවතින්නේ අලුතින් තැන් ද කඩතොළු වේලා ඇත.එම නිසා පයින් ගමන් කිරිමට නොහැකි තත්වයක් උදා වී ඇත.පාසල් රථද මෙම මාර්ගයේ ගමන් කරනු ඇත.ඒ වගේම මම මතක් කිරිමට අවශ්‍යයි ගිය ආණ්ඩුවේ කනක හෙරත් මැතිතුමගේ ප්‍රධානත්වයෙන් විවිධ අවස්ථාවලදී අධිවේගී මාර්ගයේ නිලධාරීන් සමඟ සාකච්ඡා සිදුකළා ඒ අවස්ථාවට මමද සහභාගි වුණා එහිදී මා සමඟ විවිධ මන්ත්‍රීවරු විවිධ යෝජනා මෙම මාර්ගය සම්බන්ධයෙන් ඉදිරිපත් කළා අධිවේගී මාර්ගයට සම්බන්ධ කර මෙම මාර්ග පිළිසකර කිරිම යෝජනා කිහිපයක් ඉදිරිපත් කරත්අධිවේගී මාර්ගයට බඩු රැගෙන යන මාර්ග පමණක් පිළිසකර කරන බවට ප්‍රකාශ කරන ලදි.කනක හේරත් මැතිතුමාගේ මුලිකත්වයෙන් මෙම මාර්ගය කාපට් යොදා සකස් කිරිමට යෝජනා කර ගැනිමට පුළුවන් විය.එහෙත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිතීරිති කොහොමද යන්න මම දන්නේ නැති බව ප්‍රකාශ කරන ලදි.මම යෝජනා කරනවා කඩතොළු අපගේ කාර්මික නිලධාරින්,දක්ෂ කම්කරුවන් යොදවා සකස් කිරිමටත්,පාසල් දරුවන් විශාල පිරිසක් මෙම මාර්ගයේ ගමන් කරන බැවින් මෙය කඩිනම් සේවාවක් ලෙස

ක්‍රියාත්මක කිරිම වටිනබවත්,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එම සංවර්ධන යෝජනාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන බවට ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ඉහත සඳහන් සංවර්ධන යෝජනා කිරිමට අනුමත කිරිම තීරණය විය.

**උ.3.iv.B.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

නගර අලංකරණයට බාධාවක් වන පෝස්ටර්,බැනර් ,කටවුට් සඳහා සුවිශේෂී ස්ථානයක් සැකසීම හා අනවසරයෙන් තොරව ප්‍රදර්ශනය කරන පෝස්ටර්,බැනර් ,කටවුට් සඳහා නීතිය ක්‍රියාත්මක කර දඩ මුදලක් අය කිරිමට සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මෙහි නගර අලංකරණයට බාධාවක් වන පෝස්ටර්,බැනර් ,කටවුට් සඳහා ස්ථානයක් තෝරා ගැනිම ලෙස සඳහන් වී ඇති බවත්,එය නගර අලංකරණයට බාධාවකින් තොරව පෝස්ටර්,බැනර් ,කටවුට් සඳහා ස්ථානයක් නිසි අවසරයකින් තෝරා ගැනිම ලෙස මෙහි අන්තර්ගතය විය යුතුව එතුමා ප්‍රකාශ කරන ලදි. මම මෙතැනදි කථාකරන්නේ නගර අලංකරණයට බාධාවක් පවතින පොදු ස්ථානවල අවසරයෙන් තොරව ප්‍රදර්ශනය කරන පෝස්ටර්,බැනර් ,කටවුට් සඳහාය.උපකාරක පන්ති සඳහා ප්‍රදර්ශනය කරන කටවුට් සඳහා නිසි ස්ථානයක් ස්ථාපිත කිරිම සුදුසුය. යෝජනා කරන බව පවසන ලදි.මේ සඳහා දුම්රිය මාර්ගයට මුහුණලා තියෙන ප්‍රදේශයේ ඇති වැටෙහි පුළුවන් බවත්, පදිකයන් අවහිරයක් නොවන පරිදි පෝස්ටර්,බැනර් ,කටවුට් ප්‍රදර්ශනය කිරිමට සකස් කිරිම හා නගරයේ සංචාරය කිරිම ඇති ස්ථාන පිළිබඳ පුවරු සකස් කිරිමෙන් සංචාරක කර්මාන්තයේ දියුණුවට හොඳ බවත් ප්‍රකාශ කරන ලදි.මෙය සිදු කිරිමට සභාපතිතුමා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අවසර ලබා ගෙන එම ස්ථානය ප්‍රකාශ කිරිමට සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

බැනර්, පෝස්ටර් සකස් කිරිමේදී ආයතන වලින් අනුග්‍රහය ලබා ගැනිම හා ජනතා අසීරුවට පත් නොවන පරිදි සිදු කිරිම කළ යුතුය.වැඩි අවදානයක් උපකාරක පන්ති පවත්වන ගුරුවරුන්ගේ කටවුට් සඳහා යොමු කළයුතුය.එම ගුරුවරුන් විශාල මුදලක් ඉපයුවත් පරිසරය විනාශ වන පරිදි ඉටිකොළ යොදා ගෙන කටවුට් ප්‍රදර්ශනය කිරිම පරිසරයට වන විශාල හානියක් බැවින් උපකාරක පන්තිවල බැනර් ප්‍රදර්ශනය සඳහා අයකිරිමක් සිදු කිරිමට සභාව ඍජුව මැදිහත් වී කටයුතු කිරිම කළයුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ක්ලීන් ශ්‍රී ලංකා වැඩ සටහන යටතේ මෙය ක්‍රියාත්මක වේ.නගරයේ සෑම තැනම පොර්ස්ටර් නොගැසීමට හා ඒ සඳහා මුදලක් අය කිරීම කළ යුතු බවට උපකාරක පන්ති දැනුවත් කිරීම සිදු කිරීම ගැන අපි සාකච්ඡා කරන බවට ප්‍රකාශ කරන ලදි. පසුගිය මැතිවරණයේදී අප තීරණය කලේ පෝස්ටර් නොගසන බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ඉහත සඳහන් සංවර්ධන යෝජනා කිරීමට අනුමත කිරීම තීරණය විය.

උ.iv.C. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

නගර මධ්‍යයේ ඇති ඇති මංතීරුවල විසිතුරු පැළ රෝපණය කිරීම සඳහා අදාළ ආයතනවලින් අවසර ගැනීම හා පැළ රෝපණය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා යෝජනා කරන ලදි.එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සාකච්ඡා කර අවසර ලබා ගෙන මංතීරු සකස් කිරීම සිදු කර මයික් ෆ්ලෝරා ආයතන සමඟ එක් වී විසිතුරු පැළ වගා කිරීමටත්,එම පැළ නිදැල්ලේ යන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම හා ඉගුරු,කහ යන පැළ රෝපණය කිරීම සුදුසු බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

වට රවුම සීමාව අදාළ ආයතන වලට පාලනය කිරීමට ලබාදීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ මොහොමඩ් අනීස් මැතිතුමා**

නගර මංතීරු මාර්ග සංවර්ධනයේ වැඩසටහනකි.මෙහි මංතීරු නිම කිරීමට නොහැකි වී ඇත.නගරයේ වීදි ලාම්පු කැඩී ඇත.ඒවා අලුතින් සකස් කිරීමට හා මල්පැළ ප්‍රදර්ශනය කිරීම වැනි සියල්ලම කිරීම සඳහා අපගේ ව්‍යාපාරික සමාගම් දැනුවත් කර ඔවුන් සමඟ එකතු වී නගර අලංකාරය සිදු කිරීමත්,එයින් අපට රඹුක්කන නගරය ලස්සන නගරයක් කළහැකි බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ මොහොමඩ් අනීස් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පොලීසිය මෙයට කැමති නැති බවත්, 2026 වර්ෂයේදී අධිවේගී මාර්ගය ආරම්භ කිරීම නිසා පොලීසිය, මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එකතු වී සමඟ සාකච්ඡා කිරීමෙන් සාධාරණීය පිළිතුරක් ලබා ගත හැකි යැයි ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ සංවර්ධන යෝජනා කිරීමට අනුමත කිරීම තීරණය විය.

**උ.4.යථා පරිදි කල් දී ඇති යෝජනා**
**ගෙවීම් අනුමැතිය**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා අරමුදලින් පහත සඳහන් සියලුම ගෙවීම් කිරීමට සුදුසු බවත්,අත්වැරදීමකින් අංක xxxix හා xl ගෙවීම් අනුමැතියට මුද්‍රණය වී ඇති බැවින් එම අංක දෙක න්‍යාය පත්‍රයෙන් ඉවත් කර ගැනීම සිදු කරන බවත්, ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම සියලුම යෝජනා ගරු උප සභාපති ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. තැපැල් ඡන්ද රාජකාරි කටයුතු වලදී සහතික කරන නිලධාරියා වෙනුවෙන් සහය වූ කාර්යය මණ්ඩලයට -රු2,500.00
(2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව සහතික කිරීමේ කටයුතු වෙනුවෙන් හා තැපැල් ඡන්ද රාජකාරි කටයුතු වලදී සහතික කරන නිලධාරියා වෙනුවෙන් සහය වූ කාර්යය මණ්ඩලයට රු2500.00 ක් ගෙවීම.)

ii. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් - 112,203.49
(රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර 2025/2026 වර්ෂය වෙනුවෙන් )

iii. විශ්‍රාමික කාර්මික නිලධාරි කේ.ඒ.එස් ඩී.කලුආරච්චි මයා - රු 63,325.00
(කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවූ විශ්‍රාමික කාර්මික නිලධාරි සඳහා 2025 මැයි මස දීමනාව)

iv. ආර්.ජී.එස්.නිරෝෂන් මයා,ලේකම් - රු20,000.00
(CLG/LG/1/2/4 අනුව ධුරකාලය අවසන් කරන ලද පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්ට හිමි 2025 මැයි මස දීමනාව)

v. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් - රු18,869.75
(කිරිවල්ලාපිටිය ආදාහනාගාරයේ 2025/2026 වර්ෂය වෙනුවෙන් රක්ෂණය කිරීම වෙනුවෙන්)

vi. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් - රු11,658.71
(කොම්පෝස්ට් ව්‍යාපෘතිය 2025/2026 වර්ෂය වෙනුවෙන් රක්ෂණය කිරීම සඳහා )

vii. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් - රු91,207.95
(නව සතිපොළ භූමිය 2025/2026 වර්ෂය වෙනුවෙන් රක්ෂණය කිරීම)

viii. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් - රු19,844.38
(ප්‍රාදේශීය සභා මාර්ගස්ථ මුදල් රක්ෂණ කිරීම සඳහා 2025/2026 වර්ෂය වෙනුවෙන් රක්ෂණ කිරීම.)

ix. ලේඛා ස්ටේනර්ස්,රඹුක්කන ,රඹුක්කන - රු34,080.00
(ප්‍රාදේශිය සභාව මඟින් පාලනය වන රඹුක්කන මහජන පුස්තකාලයේ මැයි මස පුවත්පත්රු. 18,830.00 ක් සහ ඉඹුල්ගස්දෙණිය මහජන පුස්තකාලයේ අප්‍රේල් මස පුවත්පත් බිල රු15,250.00ක මුදල ගෙවීම.)

x. ආර්.ජී.එස්.නිරෝෂන් මයා - රු14,273.00
(නිවාඩු දින වැටුප් ගෙවීම - 2025 මැයි මස නිවාඩු දින සේවය කිරිම අදාළව )

xi. සම්පත් එන්ටප්‍රයිසස් ,නො 380,නුවර පාර,කඩුගන්නාව - රු.11,319.90
(සෞඛ්‍ය හා සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන්)

xii. නිව් ශාස්ත්‍රෝදය ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ,අංක 10,මිහිඳු මාවත,කුලියාපිටිය - රු.16,800.00
(මුද්‍රිත ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් )

xiii. නිව් ශාස්ත්‍රෝදය ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, අංක 10,මිහිඳු මාවත,කුලියාපිටිය - රු50,350.00
(මුද්‍රිත ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් )

xiv. st’Anthony’s Distributors (pvt) Ltd,No 79,Negombo Road,Kurunegala - රු.37,552.00
(හාර්ඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන්)

xv. Central Stationeries ,No 31,Kotugodaiia Veediya,Kandy - රු.10,010.00
(ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් )

xvi. Paperline Trading (pvt) Ltd ,No14,Cross Street,Kandy - රු.50,150.00
(A4 පැකට් 50 ක් සැපයීම වෙනුවෙන් )

xvii. මහේල ඉලෙක්ට්‍රිකල්ස් ,නො 24,රෝහල අසල ,මාවනැල්ල - රු.22,600.00
(විද්‍යුත් උපකරණ සැපයීම වෙනුවෙන්)

xviii. L.H.Chandrasekara & Brothers (pvt) Ltd ,No 80,King’ s Street,Kandy - රු.32,917.50
(ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන්)

xix. Dinesh Transport Service ,Gonawila North,Dankotuwa - රු.50,900.00
(විද්‍යුත් උපකරණ සැපයීම වෙනුවෙන්)

xx. Dinesh Transport Service,Gonawila North,Dankotuwa - රු.402,450.00
( වීදි ලාම්පු හා ඒ සම්බන්ධ අනෙක් විද්‍යුත් උපකරණ සැපයීම වෙනුවෙන්)

xxi. New General Trading ,NO 06,Kumara Veediya,Kandy - රු.23,483.50.00
(ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන්)

xxii. New General Trading , NO 06,Kumara Veediya,Kandy - රු.570.00
(වාර්නිස් කොළ සැපයීම වෙනුවෙන්)

xxiii. 2025 අප්‍රේල් 28 සිට 30 දක්වා හා මැයි මාසය සඳහා අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියට අදාළ කම්කරුවන්ට දින වැටුප් වශයෙන් රු.146,160.00 ක මුදලක් ගෙවීම.

xxiv. M .L ටයර් වර්ක්ස් - රු.600.00
(RW-9023 ට්‍රේලර් රථයේ වම් පස රෝදයේ ටියුබයේ පැච් එක දමා නව ටයරයක් දැමීම වෙනුවෙන් ඉහත ආයතනයේ P.G.L.C.කුමාර නමින් ගෙවීම.)

xxv. M L ටයර් වර්ක්ස් - රු.4400.00
(SGZA -0191 බැකෝ යන්ත්‍රයේ ඉදිරි වම් රෝදයේ පැච් එකක් දැමීම හා ඉදිරි දකුණු රෝදයේ වැල් කර ගැසීම වෙනුවෙන් ඉහත ආයතනයේ P.G.L.C.කුමාර නමින් ගෙවීම.)

xxvi. W.A.R.S. විජේසූරිය මයා - රු.1320.00
(RW-5799 විමල් ට්‍රැක්ටර් ටේලරයේ වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීම වෙනුවෙන් අතින් වියදම් කරන ලද මුදල ලබා ගැනිම වෙනුවෙන් )

xxvii. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් - රු.8784.52
(SGRV-8542 විමල් ටේලරයේ පූර්ව රක්ෂණාවරණය ලබා ගැනීම වෙනුවෙන් )

xxviii. W.A.R.S. විජේසූරිය මයා - රු.1,200.00
(RC-8186 අංක දරණ ට්‍රැක්ටරයේ වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීම වෙනුවෙන් අතින් වියදම් කරන ලද මුදල ලබා ගැනිම වෙනුවෙන් )

xxix. යුනයිටඩ් මෝටර්ස් ලංකා පී.එල්.සී.ආයතනය,කුරුණෑගල,වඳුරාගල - රු.173,455.22
(PF-7429 මිට්සුබිෂි L – 200 ස්පෙටරෝ කැබ් රථයේ ටයිමින් බෙල්ට් එක මාරු කිරීම වෙනුවෙන්)

xxx. 2025.05.01 සිට 2025.05.31 දක්වා රු.2,271.37 ක දුරකථන බිල්පත ගෙවීම.

xxxi. 2025 අප්‍රේල් ,මැයි මාස වලට අදාළ විදුලි බිල්පත් වන රු.125,200.54 මුදලක් ගෙවීම.

xxxii. 2025.06.15 වන දින පවත්වන ලද සැලසුම් කමිටුවට අදාළ නිලධාරින් සඳහා රු.15,500.00 ක දීමනාව ගෙවීම.

xxxiii. සුළු වියදම් දැරීම සඳහා සුළු මුදල් අතුරු අග්‍රිමය රු.1,000.00 ක මුදලක් ලබා ගැනීම.

xxxiv. අතිකාල දීමනා රු.106,038.37 ක මුදලක් ගෙවීම.

xxxv. ඩබ්.ඩී.එස්.රණසිංහ මෙය - රු654.00
(2025.05.09 වන දින භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ප්‍රකාරව දෙවන වෙන්දේසිය සඳහා සහභාගි විම වෙනුවෙන් ගමන් වියදම් මුදල ගෙවීම)

xxxvi. අතිකාල දීමනා රු37,184.73 ක මුදලක් ගෙවීම.

xxxvii. John Keells Office Automation (PVT)Ltd - රු.50,215.03
(රඹුක්කන ප්‍රාදේශීය සභාවේ PC 054402 අංක දරණ ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට අදාළව ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ක වටිනාකමකින් යුත් ඇස්තමේන්තුව අදාළ කාර්ය ඉටු කිරිම සඳහා අනුමත කිරිම.)

xxxviii. කොම්පෝස්ට් ව්‍යාපෘතියේ පොලිතින් කුට්ටි සැකසීමේ බේල් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති රු.145,950.00 කින් යුත් ඇස්තමේන්තුව සහ එහි ජැක් දෙකෙහි හයිඩ්‍රොලික් ඔයිල් සීල් සඳහා රු.118,150.00 කින් යුත් ඇස්තමේන්තුව අනුමත කිරිම.

xxxix. 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයට අදාළව විගණන කාර්යාලය වෙතින් එවා ඇති විගණන මතය ඉදිරිපත් කිරිම.

xl. 2025.06.01 දින සිට 2025.06.13 දක්වා වියදම් පිළිබඳ විස්තර ඉදිරිපත් කිරිම.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

උපලේඛන - අංක 01

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම(රු) |
|---|---|---|---|---|
| 2025.06.02. | 579 | මුදල් භාරකරු | ආර්.ජී.එස්.නිරෝෂන් මහතාගේ මැතිවරණ දීමනා ගෙවීම | 3000.00 |
| | 580 | මුදල් භාරකරු | ආර්.ජී.එස්.නිරෝෂන් මහතාගේ මැතිවරණ දීමනා ගෙවීම | 13,000.00 |
| 2025.06.04 | 581 | ආදායම් ගණකාධිකාර,ලංකා විදුලි බල මණ්ඩලය | අප්‍රේල් මස විදුලි බිල්පත් ගෙවීම ප්‍රාදේශීය සභාව 41001.03.කොම්පෝස්ට් ව්‍යාපෘතිය9081.03 | 50,082.06 |
| | 582 | යූ.ඩී.ආර්.එන්.සුබාසිරි | අශෝක ක්‍රීඩාංගනය වෙන් කිරිම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 854.99 |
| | 583 | කේ.එස්.එස්.කුමාර | අශෝක ක්‍රීඩාංගනය වෙන් කිරිම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 1,709.98 |
| | 584 | එස්.එම්.කේ.බී.සමරකෝන් | පින්නවල පොදු වැසිකිළිය හා පුස්තකාලයේ වැසිකිළි සඳහා අවශය සැපයීම වෙනුවෙන් ගෙවීම. | 10,050.00 |
| | 585 | සමන් හේරත්,රෝවන ඇග්‍රෝ | තෘණ මර්ෂන කිරිමේ වල් නාශක සැපයිම වෙනුවෙන් ගෙවීම | 72,975.00 |
| | 586 | මුදල් භාරකරු | එම්.එන්.පද්මසිරි මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවිම | 7195.69 |
| | 587 | මුදල් භාරකරු | එන්.ජී.අජිත් ප්‍රියන්ත කුමාර මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවිම | 5353.07 |
| | 588 | මුදල් භාරකරු | ඩබ්.නලින් පුෂ්ප කුමාර මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවිම | 4,760.11 |
| | 589 | මුදල් භාරකරු | එස්.ඩබ්.සී.එන්.නන්දන මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවිම | 7,941.43 |
| | 590 | මුදල් භාරකරු | එස්.ඩබ්.ශ්‍රී.ලාල් ශ්‍රීයානන්ද මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවිම | 3,912.22 |

| | | | | |
|---|---|---|---|---|
| | 591 | මුදල් භාරකරු | එස්.එන්.නන්ද ශ්‍රී මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවීම | 8,521.11 |
| | 592 | මුදල් භාරකරු | ඩී.ඩබ්.ජී.ඒ.සඳරුවන් මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවීම | 6,077.92 |
| | 593 | මුදල් භාරකරු | එච්.ඩබ්.ඒ.අයි.එල්.වීරකෝන් මහතාගේ අතිකාල ගෙවීම | 6,639.36 |
| | 594 | මුදල් භාරකරු | එස්.ඩබ්.පී.ධර්මසේන මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවීම | 5,171.57 |
| | 595 | මුදල් භාරකරු | ජේ.එන්.එල්.ජයසිංහ මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවීම | 1,278.17 |
| | 596 | මුදල් භාරකරු | ජී.ඒ.චන්ද්‍රසේන මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවීම | 9,146.89 |
| | 597 | මුදල් භාරකරු | පී.ජී.ප්‍රේම ශ්‍රී මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවීම | 9,072.22 |
| | 598 | මුදල් භාරකරු | ජී.ජී.බී.ඒ.කුමාර් මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවීම | 7,516.00 |
| | 599 | මුදල් භාරකරු | කේ.ඒ.එස්.කලුආරච්චි මහතාගේ ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 600 | මුදල් භාරකරු | කේ.ඒ.එස්.කලුආරච්චි මහතාගේ ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 601 | මුදල් භාරකරු | කේ.ජී.ධනුක ශ්‍රීමාල් මහතාගේ අප්‍රේල් මස අතිකාල ගෙවීම | 7,290.04 |
| 2025.06.06 | 602 | ඩබ්.ඩී.එස්.රණසිංහ | ශාණ්ඩ සමීක්ෂණ වෙන්දේසිය සඳහා සහභාගි වීම වෙනුවෙන්ගමන් වියදම් ගෙවීම | 634.00 |
| | 603 | කේ.පී.එච්.වීරසේකර | ජල නල එලීමට අදාළ ඇප තැන්පතු මුදල ආපසු ගෙවීම | 2000.00 |
| 2025.06.09 | 604 | Kegall distributors(pvt)ltd. | ආදාහනාගාරය සඳහා කි.ග්‍රෑ 37.5 ක ලිට්රෝගෑස් සිලින්ඩර් සැපයීම වෙනුවෙන් ගෙවීම | 105,395.00 |
| | 605 | ඩබ්.ජී.එස්.ආර්.බණ්ඩාර | SG YU 6935 අංක දරණ ත්‍රීරෝද රථයේ පූර්න වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම | 11,630.00 |
| | 606 | ශ්‍රී ලංකා ටෙලිකොම් PLC කෑගල්ල | 035-2265274 දුරකථනයට අදාළ දුරකථන බිල්පත ගෙවීම | 2,829.71 |
| | 607 | උඩුගම එක්සත් වීර ග්‍රාම සංවර්ධන සමිතිය | උඩුගම ගෝනාඋල්ල මාර්ගය සංවර්ධනය කිරීම LGR(S3)-2413716 10% රැඳවුම් ගාස්තු ගෙවීම | 48,475.00 |
| | 608 | හුරීමලුව ගොවි සංවිධානය | උඩුගම ගෝනාඋල්ල මාර්ගය සංවර්ධනය කිරීම LGR(S3)-2413716 10% රැඳවුම් ගාස්තු ගෙවීම | 48,475.00 |
| | 609 | POST MASTER GENERAL මුද්දර ගාස්තු | තැපැල් මුද්දර ගාස්තු වටිනාකම අලුත් කිරීම වෙනුවෙන් ගෙවීම | 30,000.00 |
| | 610 | දොඹේමඩ නැගෙනහිර ගොවි සංවිධානය | ගිරිගමුව මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් LGR(S3)-2413713 10% රැඳවුම් ගාස්තු ගෙවීම | 48,435.94 |
| | 611 | වැලිගමුව සුළු ගොවි සංවිධානය | නාඹිරිත්ත 1 අතුරු මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් LGR(S3)-2413710 10% රැඳවුම් ගාස්තු ගෙවීම | 48,475.00 |
| | 612 | පුබුදු ගොවි සංවිධානය | පුවක්මොටේ ඉහළගම මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් LGR(S3)- 2413705 10% රැඳවුම් ගාස්තු ගෙවීම | 47,933.54 |
| | 613 | උඩුගම එක්සත් වීර ග්‍රාම සංවර්ධන සමිතිය | කඩිගමුව උඩුගම දෙබෝවත්ත මාර්ගය සංවර්ධනය වෙනුවෙන් RIP-2413702 10% රැඳවුම් ගාස්තු ගෙවීම | 96,282.52 |
| | 614 | සාමාන්‍යාධිකාරි,ජාතික ජල සම්පාදන මණ්ඩලය | ජල බිල්පත ගෙවීම | 89,889.30 |

| | | | | |
|---|---|---|---|---|
| | 615 | සාමාන්‍යාධිකාරි,ජාතික ජල සම්පාදන මණ්ඩලය | ජල බිල්පත ගෙවීම | 13,214.00 |
| | 616 | ඩබ්.ජී.එස්.ආර්.බණ්ඩාර | SG YU 6935 අංක දරණ ත්‍රීරෝද රථයේ අලුත්වැඩියා කිහිපයක් සිදු කිරීම වෙනුවෙන් ගෙවීම | 10,820.00 |
| | 617 | Diector Genaral of Pension | පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක බිල්පත් ගෙවීම ජනවාරි,පෙබරවාරි,මාර්තු | 30,884.97 |
| 2025.06.11 | 618 | Public Service Provident fund | සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීම | 26,100.00 |
| | 618 | Manager peole's bank Rambukkana | 2025 අප්‍රේල් මස 28 සිට මැයි 31 දක්වා කාලය සඳහා අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපාතියට අදාළ සේවකයින්ය වැටුප් ගෙවීම | 84,180.00 |
| | 618 | Manager bank Celon Rambukkana | 2025 අප්‍රේල් මස 28 සිට මැයි 31 දක්වා කාලය සඳහා අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපාතියට අදාළ සේවකයින්ය වැටුප් ගෙවීම | 35,880.00 |
| 2025.06.13 | 619 | Sri Lanaka Insurance Corporation | ප්‍රාදේශිය සභාවට අයත් පැරණි වෙළඳ සංකීර්ණය සඳහා රක්ෂණාවරණ මුදල් ගෙවීම | 19,759.37 |
| | 620 | මුදල් භාරකරු | ආර්.ජී.එස්.නිරෝෂන් මහතාගේ සබරගමුව පළාත් පාලන කොමසාරිස් CLG/LG/1/2/4/අනුව ධුර කාලය අවසන් කිරන ලද පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්යට දීමනා ගෙවීම | 20,000.00 |
| | 621 | මුදල් භාරකරු | නැවත සේවයේ යෙදවූ විශ්‍රාමික කාර්මික නිලධාරි කේ.ඒ.ඩී.කලුආරච්චි මහතාගේ මැයි මස දිමනා ගෙවීම | 63,300.00 |
| | 622 | මුදල් භාරකරු | ඩබ්.ජී.චන්ද්‍රා කුමාරි මහත්මියගේ මැතිවරණ දීමනා ගෙවීම | 6,000.00 |
| | 623 | මුදල් භාරකරු | ඩබ්.ජී.චන්ද්‍රා කුමාරි මහත්මියගේ මැතිවරණ දීමනා ගෙවීම | 3,000.00 |
| | 624 | මුදල් භාරකරු | ඩබ්.ජී.චන්ද්‍රා කුමාරි මහත්මියගේ මැතිවරණ ගමන් වියදම් දීමනා ගෙවීම | 2,672.00 |
| | 625 | මුදල් භාරකරු | ඩබ්.ජී.චන්ද්‍රා කුමාරි මහත්මියගේ මැතිවරණ දීමනා ගෙවීම | 7,000.00 |
| | 626 | මුදල් භාරකරු | බී.ඒ.අසංක හංස කුමාර මහතාගේ මැතිවරණ ගමන් වියදම් දීමනා ගෙවීම | 2,254.00 |
| | 627 | මුදල් භාරකරු | බී.ඒ.අසංක හංස කුමාර මහතාගේ මැතිවරණ දීමනා ගෙවීම | 6,000.00 |
| | 628 | ජී.ජී.එස්.බණ්ඩාර | මැතිවරණ දීමනා ගෙවීම | 4,000.00 |
| | 629 | ජී.ජී.එස්.බණ්ඩාර | මැතිවරණ ගමන් වියදම් දීමනා ගෙවීම | 1,400.00 |

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

  වියදම් පිළිබඳ විස්තරයේ 618 වවුචර් අංකයෙන් ගෙවීම් තුනක් සිදුකර ඇති බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පෙන්වා දෙන ලදි.
- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

  එම අංක 618 වවුචරයේ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඊළඟ සභා වාරයෙදී ඉදිරිපත් කරන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ ගෙවීම් සහිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ඉහත ගෙවීම් අනුමත කිරිමට තීරණය විය.

(උ).II.යථා පරිදි කල් දී නොමැති යෝජනා

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

යථා පරිදි කල් දී නොමැති යෝජනා ලෙස පහත සඳහන් යෝජනා ගරු සභාපති විසින් ඉදිරිපත් කරන ලදි.එම සියලුම යෝජනා ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. එක්සත් වීර ග්‍රාම සංවර්ධන සමිතිය - රු69,350.00
(අරඹේගේන සිට කහකොලලන්ද ,එලුගල්ල මාර්ගයේ ඉදිකිරීම වෙනුවෙන්)

ii. සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය -රු36,875.10
(ප්‍රාදේශිය සභා භූමියේ පිටුපස ගරාජය සැදීම වෙනුවෙන්)

iii. පුබුදු වැඩිහිටි සමිතිය - රු858,315.75
(සතිපොළ භූමියේ ඉදිකිරීමට යෝජිත සෙල්ලම් මිදුලේ ආරක්ෂිත වැට ඉදිකිරීම වෙනුවෙන්)

iv. සී/සී රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය -රු1160.00
(රඹුක්කන හා දෙල්දෙණිය පෙර පාසල් දරුවන් සඳහා ත්‍යාග ඇසුරුමට අවශ්‍ය කවර ලබා ගැනිමට වෙනුවෙන්)

v. 2025 ජුනි මස ස්ථිර සේවක වැටුප් වන රු7,522,578.97 ක මුදල ගෙවීම.

vi. ආදාහනාගාරය සඳහා 37.5 kg ක ලිට්රෝ ගෑස් සිලින්ඩර් 06 ක් kegalle Distributors(pvt)Ltd.වෙතින් හා 37.5 kg ක ලාෆ් ගෑස් සිලින්ඩර් 06 ක් ලීලා ස්ටෝර්ස් වෙතින් ලබා ගැනිම.

vii. පහත සඳහන් දේපල වල ගිනි නිවීමේ උපකරණ සේවා කිරිමට සුදුසුකම්ලත් ආයතන වලින් මිල ගණන් කැඳවීම.
1.ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ල
2.ආදාහනාගාරය
3.ඉඹුලුගස්දෙණිය
4.වෙළඳ සංකීර්ණය

අදාළ ගෙවීම් සහිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ඉහත ගෙවීම් අනුමත කිරිමට තීරණය විය.

(එ).සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරිම.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**
  ඉඹුල්ගස්දෙණිය ,පොල්ගහවෙල මාර්ගයේ දෙපස ඇති විදුලි පහන් දිගටම අක්‍රීය වී ඇත. එම මාර්ගයේ ප්‍රධාන පොහොයවල් වලදී වම්ටාරම පූජා භූමියට බැතිමතුන් විශාල ප්‍රමාණයක් වන්දනාවේ යන බැවින් විදුලි පහන් අක්‍රීය වීමේන් අනතුරු සිදු විය හැකි බැවින් එම මාර්ගයේ ඇති විදුල් පහන් සක්‍රීය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් යෝජනා කරන ලදි.
- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**
  අපගේ වැඩ කරන සේවක මහතුන් සාමාන්‍ය ලෙස කමිසයක් ,කලිසමක් ඇදගෙන වැඩකරන බැවින් විදුලි කාර්මිකයන් සඳහා ප්‍රමිතියෙන් ඉහළ හොඳ ඇඳුම් කට්ටලයක් ලබාදෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.
- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**
  සංවර්ධන කටයුතු වලට,රැස්වීම් වලට ,දේශපාලන ක්ෂේත්‍රයේ කටයුතු වලට පක්ෂ පාට භේදයකින් තොරව ඔබතුමන්ලාත් සමඟ කටයුතු කරන අතර රඹුක්කන ආසනයේ කෑගල්ල දිස්ත්‍රික්යේ පමණක් නොව ලංකාව පුරා ව්‍යාප්ත වී ඇති එක්සත් වීර යෞවන සමාජය ලියාදිංචි කිරිමට නොහැකි තත්වයක් උදා වී ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.
- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**
  මන්ත්‍රී ප්‍රතිපාදන ඇත. පාරවල් සකස් කිරිමට හා සංවර්ධන කටයුතු වලට එම ප්‍රතිපාදන සඳහා මන්ත්‍රිවරුන් ඉලිලීමක් සිදුකළ යුතු ද නැත්නම් මන්ත්‍රීවරුන්ට එක ගානේ හරි සමානව ලබා දෙනවාද යන්න පැහැදිලි කිරිමක් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.
- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
  ගම්බද අනවසර ඉදිකිරිම් වැඩිය. එම නිසා පාර දෙපස වෙළදාම් කරන අනවසර ඉදිකිරිම් ඉවත් කිරිම කරන බවට ආරංචියක් පවති. කොට්ඨාශයේ හොඳ ප්‍රතිපාදන බොහොමයක් පවතිද්දි ගම්බද මාර්ගවල කොස් පොළොස් ,පළා විකුණන අය ඉවත් කිරිමට වඩා අනවසර ඉදිකිරිම් බොහොමයක් ඉවත් කිරිම තිබෙන බවත්,ඒවා ඉවත් නොකරයි කියලා විශ්වාස කරන බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.
- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
  විදි ලාම්පු ,කැලිකසල සම්බන්ධයෙන් විගණන ප්‍රශ්න ඇත.විදි පහන් වලට 3% ක් ප්‍රමාණයක් නිදහස් කර ඇති තැන්වලට 10% ක ප්‍රමාණයක් යෙදවීම් කර ඇත. විගණන ප්‍රශ්න වල අසු නොවී කර ගෙන යාමත්,ඉදිරියේදී සම්බන්ධීකරණ කමිටුව සහභාගි වීමට දැනුවත් කර ඇත.එහිදී මේ සම්බන්ධයෙන් ක්‍රියාකරන අකාරය දැන ගැනිමට හැකිවන බවත්,යෝජනා සඳහා ප්‍රතිපාදන තියෙන ප්‍රමාණ අනුව කිරිම සුදුසු බවත්, ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026 වර්ෂය සඳහා අයවැය යෝජනා ඉදිරිපත් කිරිමත්,ඒ අනුව යෝජනා ක්‍රියාත්මක කිරිමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.ප්‍රතිපාදන විමධ්‍යගතව හා අමාත්‍යාංශ මුදල් යොදා කිරිමට අමාත්‍යවරයා අපව දැනුවත් කර ඇත.අපගේ ප්‍රතිපාදන අනුව කටයුතු කරමු යැයි මන්ත්‍රිතුමන්ලා සඳහා ප්‍රකාශ කරන ලදි.පියරත්න මැතිතුමා පැවසූ කඩ ඉවත් කිරිමක් නොකරන බවත්,වෙළඳපොලේ සිටින රෙදි වෙළෙන්දන්ගේ ප්‍රශ්නය තැන් තැන්වල ඇති කඩ එක තැනකට ගෙන එනවා මිස පාරට දමන්නට අදහස් කරලා නැත ඒවා සාවද්‍ය තොරතුරු ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

<u>අවසානය</u>

අද දින පැවති මංගල සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ,ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,මාධ්‍ය වේදීන්ටත් ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.00 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව,

**සංශෝධන**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

දෙවැනි පිටුවේ සංශෝධනය කළයුතු දේවල් සංශෝධන වී නොමැති බව ප්‍රකශ කරන ලදි. ප්‍රතිපත්ති මාලාවේ ඇති පොහොසත් රටක් ලස්සන හෙටක් ප්‍රතිපත්තියට මා ඇතුළු කණ්ඩායම සහයෝගය ලබා දෙන බව සටහන් වී නොමැති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

නමවැනි පිටුවේ සඳහන් කමිටු සඳහා පත්කිරීම් වලට විරෝධතාවක් නොමැති බව සටහන් වී ඇතත් එය කමිටු සඳහා පත්කළ පුද්ගලයින්ට විරෝධතාවයක් නොමැති බව විය යුතු බවත්,ඊට අමතරව ඔබතුමා පැවසුවා අපගේ දේශපාලනයට සහය දුන් අය නිසා මේ අය පත් කළයුතු ය බව ඒක දේශපාලනීකරණය නොකරන ලෙස පැවසුවත් එය සටහන් වී නොමැති බව ප්‍රකාශ කරන ලදි.

දහවැනි පිටුවේ සඳහන් මහජන ගැලරිය විවෘත කිරිම පනතේ තිබෙන බැවින් ඒ සඳහා විශේෂ යෝජනාවක් ගෙන ඒමට අවශ්‍ය නොවන බවත්,අවශ්‍ය අයට සහභාගි වීමට හැකිබව ප්‍රකාශ කළ අතර එය සඳහන් වී නොමැති බව හා සංඛ්‍යාවක් ගැන සටහන් කර නැති බව ප්‍රකාශ කරන ලදි.

එකළොස්වන පිටුවේ සඳහන් මහසභා රැස්වීමේදී කණගාටුව ප්‍රකාශ කළා ලෙස සටහන් වී ඇති නමුත් එය මහ මැතිවරණය වෙනුවෙන් ලෙස නිවැරදි විය යුතු බව ප්‍රකාශ කරන ලදි.

දහතුන්වන පිටුවේ මාර්ග පළුදු කිරිම ගැන සඳහන් කරන විට මාර්ග කඩතොළු කිරිමට ඇප මුදලක් අය කරන බවත්,ඒ වගේම කාර්මික නිලධාරිනගේ පසු ඇගයීමට ලක් කිරිම කළ යුතු බව සටහන් වී නොමැති බව ප්‍රකාශ කරන ලදි.

දහසය වැනි පිටුවේ සඳහන් කරුණු දැක්විම පිළිබඳ නොව ගාමිණී සමරකෝන් මන්ත්‍රීතුමාට මෙම මාර්ගය සඳහා විශේෂ සටහනක් කිරිමට අරාධනා කරනවා යැයි සටහන් වියයුතු බව ප්‍රකාශ කරන ලදි.ගියවර සභාවේ දිවුරුන් දෙන අවස්ථාවේ නොව දිවුරුම් දී පළමුවෙන් ශ්‍රමදායකත්වයෙන් මෙම මාර්ගය පිළසකර කළා ලෙස සඳහන් විය යුතු බවත්,මාර්ගය පිළිබඳ නිලධාරින් සමඟ සාකච්ඡා කළ බව හා අධිවේගී මාර්ගයට භාණ්ඩ ප්‍රවාහනය කරන මාර්ග පමණක් පිළිසකර කරන නමුත් මෙම මාර්ග කනක හේරත් මැතිතුමාගේ ප්‍රදානත්වයෙන් පිළිසකර කිරිමට යෝජනා විය. බවත්, වත්මන් ආණ්ඩුව ඒ යෝජනාවට කුමක් කරයිද කියලා මම දන්නේ නැති බව ප්‍රකාශ කළ ඇති බවට නිවැරදි විය යුතු බව ප්‍රකාශ කරන ලදි.

දහඅට වැනි පිටුවේ සඳහන් මංතීරු සකස් කිරිම නොව මංතීරු මැද කොටසේ මල් වගා කිරිමට යෝජනා කරන ලද බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

2025.06.20 මහ සභා වාර්තාව ඉහත සංශෝධන සහිතව සභා සම්මත විය.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව,